ශ්‍රී සුමංගල විද්‍යාලය - පානදුර

Sri Sumangala College - Panadura

ප්‍රථම වාර පරීක්ෂණය - 2020 මාර්තු

1st Term Test - March 2020

| | | | |
|---|---|---|---|
| ශ්‍රේණිය Grade 10 | විෂයය Subject විද්‍යාව | පත්‍රය Paper II | කාලය Time 03 hour |

නම :- ........................................................................................ පංතිය :- ...........................

සැලකිය යුතුයි :-

- පිළිතුරු ප්‍රශ්න පත්‍රය තුළ සපයා ඇති ඉඩකඩ ප්‍රමාණය තුළ ලියන්න.
- A කොටසේ ප්‍රශ්න සියල්ලටම හා B කොටසේ ප්‍රශ්න 5න් 3කට පමණක් පිළිතුරු, සපයාගත් කඩදාසි තුළ ලියන්න.
- අවසානයේ A කොටස හා B කොටසේ පිළිතුරු එකට අමුණා භාර දෙන්න.

**A කොටස**

1) A) පහත රූපයේ දැක්වෙන්නේ වැවක් වටා වූ වැව් ඉවුරකි.




A සිට ගමන් ඇරඹූ මිනිසෙක් ඊතල වලින් දිශාව දෙසට වැව් ඉවුර දිගේ ඒකාකාර වේගයකින් ඇවිද යයි.

I) ඔහු වැව් ඉවුර දිගේ එක් වටයක් සම්පූර්ණයෙන් ඇවිද ගියේ නම් ඔහු ගිය දුර කොපමණ ද?

..............................................................................................................(ල. 01)

(II) ඒ සඳහා මිනිත්තු 5ක් ගතවුණි නම් ඔහුගේ මධ්‍යක වේගය සොයන්න.

..............................................................................................................

.......................................................................................................................

.......................................................................................................................(ල. 02)

(III) ඔහු A සිට ඇවිද යන අතර C හි මදක් නතර විය. එවිට ඔහුගේ විස්ථාපනය නිවැරදිව දක්වන්න.

.......................................................................................................................

.......................................................................................................................

.......................................................................................................................(ල. 01)

(IV) ඔහ්ගේ ගමනේ වේගය වැඩිකර ගැනීමට ගතහැකි ක්‍රියාමාර්ගයක් ලියා දක්වන්න.

.......................................................................................................................

.......................................................................................................................(ල. 01)

B) වැව් ඉවුර අයිනේ තැන් කිහිපයකම කිරි අල (ගහල) පඳුරු වැවී තිබෙනු දක්නට ලැබුනි.

(I) කිරි අල වල බහුලව ඇති කාබෝහයඩ්‍රේටය කුමක් ද?

.......................................................................................................................(ල. 01)

(II) කාබෝහයිඩ්‍රේටයක් සඳහා වන පොදු සූත්‍රය ලියන්න.

.......................................................................................................................(ල. 01)

(III) තම්බා ගත් කිරි අල කැබැල්ලක් හොඳින් පොඩිකර තලපයක් සේ සාදා එය කෝවක දමා තදින් රත් කරයි. එවිට ඔබට දැකගත හැක්කේ කුමක් ද?

.......................................................................................................................

.......................................................................................................................

.......................................................................................................................(ල. 02)

(IV) සරලම කාබෝහයිඩ්‍රේට කාණ්ඩය කෙසේ හැඳින්වේ ද?

.......................................................................................................................(ල. 01)

C) (I) කෝවක දමා යම් ද්‍රව්‍යයක් දහනය කරවනු ලබන අවස්ථාවකදී භාවිතයට ගනු ලබන වෙනත් විද්‍යාගාර උපකරණ දෙකක් සඳහන් කරන්න.

.......................................................................................................................(ල. 02)

(II) ඕනෑම කාබෝහයිඩ්‍රේටයක් තුල කාබන් (C) අඩංගු වේ. කාබන් වායුගෝලීය ඔක්සිජන් සමඟ සම්පූර්ණයෙන් දහනය වීමෙන් සෑදෙන ඵලය කුමක් ද?

.......................................................................................................................(ල. 02)

(III) උදාසීන කාබන් (C) පරමාණුවේ ඉලෙක්ට්‍රෝන වින්‍යාසය ලියන්න.

……………………………………………………………………………………………………………(ල. 01)

(IV) කාබන්වල විද්‍යුලිය සන්නයනය වන බහුරූපී ආකාරය දක්වන්න.

……………………………………………………………………………………………………………(ල. 01)

2) a) 10 ශ්‍රේණියේ සිසුවකු ගත් දිවා ආහාර වේලක අඩංගු වූ දෑ පහත රූපයේ දැක්වේ.







I) <u>ආහාර වේල තුළ අඩංගු වන</u> ප්‍රෝටීන හැර සජීව පදාර්ථයේ අඩංගු ප්‍රධාන කාබනික සංයෝග 2ක් නම් කරන්න.

……………………………………………………………………………………………………………(ල. 02)

(II) ඔබ (I) හි සඳහන් කළ එක් කාබනික සංයෝගයක් තුළ බහුලව අඩංගු වන ආහාරය ඉහත ආහාර වේලෙන් තෝරා ලියන්න.

කාබනික සංයෝගය ආහාරය

……………………………………… ……………………………………………… (ල. 01)

(III) සීනිවල අඩංගු ඩයිසැකරයිඩය නම් කරන්න.

……………………………………………………………………………………………………………(ල. 01)

(IV) විටමින් B අවශෝෂණණයට දායක වන මුදවපු කිරි වල බහුල ඇති ඛනිජ ලවණය සඳහන් කරන්න.

……………………………………………………………………………………………………………(ල. 01)

(V) විටමින් K බහුලව පවතින ආහාරය කුමක් ද?

……………………………………………………………………………………………………………(ල. 01)

B) I) පරිප්පු නිස්සාරකයකට බයියුරේට් ද්‍රාවණය දැමූවිට ඔබ දකින නිරීක්ෂණය කවරේ ද?

……………………………………………………………………………………………………………(ල. 01)

(II) තනුක සල්ෆියුරික් අම්ලය යොදා ඔක්සිහරණය කිරීමෙන් අනතුරුව බෙනඩික් ද්‍රාවණය මගින් හඳුනා ගැනීමට වඩාත් ඉඩ ඇති ආහාරය, දී ඇති ආහාර අතුරින් කවරක් ද?

……………………………………… ……………………………………………… (ල. 01)

(III) මුදවන ලද කිරි වල යෝදය ස්වල්පයක් ගෙන සූඩාන් III ද්‍රාවණය යොදා සෙලවූ විට ලැබෙන වර්ණයේ වෙනස කුමක් ද?

……………………………………………………………………………………………..….(ල. 01)

C) (I) ශාක සෛලයක අඩංගු වන එහෙත් සත්ව සෛලයක අඩංගු නොවන ඉන්ද්‍රියිකා 2ක් සඳහන් කරන්න.

……………………………………………………………………………………………..…….(ල. 02)

(II) සෛල විභාජනයේ ප්‍රධාන ක්‍රම දෙක දක්වන්න.

……………………………………………………………………………………………..…….(ල. 02)

(II) ශාක සෛලයක පිටත ආවරණය සාදන කාබෝහයිඩ්‍රේටය කුමක් ද?

……………………………………………………………………………………………..…….(ල. 01)

3) a) A හා B නම් වස්තු 2ක චලිතය දැක්වෙන විස්ථාපන කාල ප්‍රස්ථාරයක් සහ ප්‍රවේග කාල ප්‍රස්ථාරයක් පහත දී ඇත.







I) A වස්තුවේ උපරිම විස්ථාපනය කොපමණ ද?

……………………………………………………………………………………..……………(ල. 01)

(II) A වස්තුවේ පැවති ඒකාකාර ප්‍රවේගය ගණනය කරන්න.

………………………………………………………………………………………………………

……………………………………………………………………………………………..…….(ල. 02)

(III) A වස්තුවේ චලිතය විස්තර කරන්න.

………………………………………………………………………………………………………

……………………………………………………………………………………………..…….(ල. 02)

B) (I) B වස්තුව ලඟාවී ඇති උපරිම ප්‍රවේගය කොපමණ ද?

………………………………………………………………………………………………………

……………………………………………………………………………………………..…….(ල. 01)

(II) ප්‍රස්ථාරය ඇසුරෙන් B වස්තුවේ ත්වරණය ගණනය කරන්න.

.................................................................................................................................

.................................................................................................................................(ල. 02)

(III) B වස්තුවේ ස්කන්ධය 500kg නම් මුල් තත්පර 4 තුලදී වස්තුව මත ක්‍රියාකරන අසංතුලිත බලය කොපමණද?

.................................................................................................................................

.................................................................................................................................

.................................................................................................................................(ල. 02)

(IV) B වස්තුව අත්කරගත් උපරිම ප්‍රවේගයෙන් චලිතය වන විට එහි ගම්‍යතාවය කොපමණ ද?

.................................................................................................................................

.................................................................................................................................(ල. 02)

C) (I) දුර, කාලය, විස්ථාපනය, ප්‍රවේගය යන රාශීන් දෛශික සහ අදිශ රාශී වශයෙන් වර්ග කරන්න.

.................................................................................................................................

.................................................................................................................................(ල. 02)

(II) ගුරුත්වජ ත්වරණය යටතේ $300ms^{-1}$ ක ආරම්භක ප්‍රවේගයක් ඇති වස්තුවක් උපරිම උසට ඉහළ නැගීමට අදාල ප්‍රවේග කාල ප්‍රස්ථාරය අඳින්න. (ල. 01)




4) A) ආවර්තිතා වගුවේ පළමු මූලද්‍රව්‍ය 20ට අයත් මූලද්‍රව්‍ය 5ක පරමාණුක ආකෘති පහත දක්වේ. දී ඇති සංකේත පමණක් භාවිතා කර පිළිතුරු සපයන්න.




I) පරමාණුක ආකෘති අතුරින් න්‍යෂ්ඨික ආකෘතිය ඉදිරිපත් කරන්නේ කවුද?

……………………………………………………………………………………………..……………(ල. 01)

(II) තුන්වන ආවර්තයට අයත් මූලද්‍රව්‍ය යුගල තෝරා ලියන්න.

…………………………………………………………………………………………………..……(ල. 01)

(III) දී ඇති පරමාණු අතරින් විද්‍යුතය සන්නයනය කළ හැකි බහුරූපී ආකාරයක් දක්වන මූලද්‍රව්‍යයට අයත් අක්ෂරය කුමක් ද?

………………………………………………………………………………………………..………(ල. 01)

(IV) D මූලද්‍රව්‍යයේ භෞතික ගුණයක් ලියන්න.

……………………………………………………………………………………………..…………(ල. 01)

(V) එකම කාණ්ඩයට අයත් විය හැකි මූලද්‍රව්‍ය 2ක් ලියන්න

……………………………………………………………………………………………..…………(ල. 02)

(VI) රසායනික බන්ධන නොසාදන මූලද්‍රව්‍ය කුමක් ද?

……………………………………………………………………………………………..…………(ල. 01)

B) (I) සමස්ථානික යන්න හඳුන්වන්න.

……………………………………………………………………………………..……………………

…………………………………………………………………………..……………………………(ල. 02)

(II) $^{b}_{a}X$ යනු මූලද්‍රව්‍යයන් නම් එහි ඉලෙක්ට්‍රෝන වින්‍යාසය ලිවීමට උපයෝගි කරගනු ලබන්නේ a, b අතුරින් කවරක් ද?

………………………………………………………………………………..………………………(ල. 01)

(III) $A_{(g)} \rightarrow A^{+}_{(g)} + e$ යන සමීකරණයෙන් දක්වා ඇත්තේ මූලද්‍රව්‍යයක් සතු කවර රසායනික ගුණයද?

……………………………………………………………………………………………..…(ල. 01)

C) (I) මැග්නීසියම් ලෝහය ආවර්තිතා වගුවේ කවර ආවර්තයට හා කීවෙනි කාණ්ඩයට අයත්වේ ද?

ආවර්තය ………...……………………………………………………………………..……………

කාණ්ඩය ……………………………………………………………………..………………(ල. 02)

(II) මැග්නීසියම් පටියක් දැවීමේ දී ඔබ දකින නිරීක්ෂණයක් ලියන්න.

…………...………………………………………………………………………..…………………(ල. 01)

(III) බහු පරමාණුක අයනයක් වන පොස්පේට් කාණ්ඩයෙහි සංයුජතාවය කීයද?

………….………………………………………………………………………..……………(ල. 01)

(ලකුණු 15)

## B කොටස

5) A) I) එක්තරා වගා බිමක වගාකර තිබූ බෝග වගා බිමක පහත සඳහන් ඌනතා ලක්‍ෂණ හඳුනාගන්නා ලදී. එම ඌනතා ලක්‍ෂණවලට හේතු වූ කවර ඛනිජ ලවණ අඩු වීමද යන්න දක්වන්න.

අදාල ඛණිජ ලවණයන් වරහන් තුළින් තෝරා ලියන්න.

(අයන්, කැල්සියම්, පොටැසියම්, සින්ක්)

1. පත්‍ර අනුස්ථය මිය යෑම
2. පත්‍ර අනවශ්‍ය ලෙස ඝණකමින් යුතු වීම.
3. පත්‍රවල රතු හා දම් වර්ණ ලප මතුවීම
4. ලපටි පත්‍රවල හරිතක්‍ෂය ඇතිවීම. (ල. 04)

II) විටමින් B වල බහුලව පවතින ප්‍රභේද 2ක් දක්වන්න. (ල. 02)

B) අකාබනික සංයෝගයක් වන ජලය බොහෝ ජීවීන්ගේ ශරීර බරෙන් $\frac{2}{3}$ ක් පමණ වේ.

I) ජලයේ සුවිශේෂී ගුණ 2ක් ලියන්න. (ල. 02)

II) ජලජ ජීවීන්ට ජීවත්වීමේ පරිසරයක් ලෙස ජලයේ ඝණත්වයට වඩා අයිස්වල ඝණත්වය අඩුවීමේ බලපාන ආකාරය පැහැදිලි කරන්න. (ල. 02)

III) ආහාර සංඝටකයක් කෝවක දමා දහනය කරන අතරතුර වීදුරු තහඩුවක් ඊට ඉහළින් අල්ලා ඒ මත සෑදෙන ද්‍රව බිංදු ජලයද යන්න හඳුනා ගැනීමට භාවිතා කළ හැකි ද්‍රව්‍යක් සඳහන් කරන්න. (ල. 02)

C) I) ප්‍රරෝහනය වන බීජවල බහුල ඩයිසැකරයිඩය කුමක්ද? (ල. 01)

II) ශාකවල නොමැති එකම සීනි වර්ගය කුමක් ද? (ල. 01)

III) ආහාරයක ඇති ප්‍රෝටීන් හඳුනාගැනීමේ පරීක්‍ෂාවක් පියවර 03කින් ඉදිරිපත් කරන්න. (ල. 03)

IV) ප්‍රෝටීන්වල කාර්‍යභාර්යන් 3ක් ලියන්න. (ල. 03)

6) A) මැග්නීසියම් ලෝහය පටිලෙස බොහෝවිට විද්‍යාගාරයේදී හමුවේ. සෝඩියම් ලෝහය කැබලි ලෙසින් පැරෆින් තෙල් තුළ ගබඩා කර ඇත.

I) මැග්නීසියම් පටි භාවිතාට පෙර හොඳින් සූරා ශුද්ධ කල යුතුයි. ඒ ඇයි? (ල. 01)

II) සෝඩියම් ලෝහය පැරෆින් තෙල් තුළ ගබඩා කරන්නේ ඇයි? (ල. 01)

III) සෝඩියම් හා මැග්නීසියම්වල ඝණත්ව ජලයේ ඝණත්වට සාපේක්‍ෂව සසඳන්න (ල. 02)

IV) සිසිල් ජලය සමඟ සෝඩියම් හ ාමැග්නීසියම් දක්වන ප්‍රතික්‍රියාවන් සසඳන්න. (ල. 02)

V) සෝඩියම් ජලයට දැමීමේදී සැලකිය යුතු කරුණක් ලියන්න. (ල. 01)

B) ආවර්තිතා වගුවෙන් උපුටාගත් කොටසක් මෙහි දැක්වේ. දී ඇති සංකේත සැබෑ සංකේත නොවේ.




I) Bහි ඉලෙක්ට්‍රෝන වින්‍යාසය 2,5 නම් A හා D හි ඉලෙක්ට්‍රෝන වින්‍යාසය ලියන්න. (ල. 02)

A - D -

II) a) E අයත් කාණ්ඩය කුමක් ද? (ල. 01)

b) එම කාණ්ඩය හඳුන්වන නම කුමක් ද? (ල. 01)

III) මෙම මූලද්‍රව්‍ය අයත්වන ආවර්තය කුමක් ද? (ල. 01)

IV) A, B, D හි සැබෑ සංකේත ලියන්න (ල. 03)

A - ☐ B - ☐ D - ☐

C) ජල පිරිපහදුවේදී ක්ලොරීන් වායුව භාවිතා හි සම්මත අංකන 2ක් පහත දැක්වේ.

$^{35}_{17}Cl$ $^{37}_{17}Cl$

I) ක්ලෝරීන් පරමාණු සම්බන්ධ කවරක් මෙම සංකේත මඟින් දැක්වේ ද? (ල. 01)

II) $^{35}_{17}Cl$ හි 17 හා 35 යන සංඛ්‍යාවලින් නිරූපනය වන Cl පරමාණුව සතු කවර ලක්ෂණ යුගලය ද?

17 …………………….. 35.................................. (ල. 02)

III) ඉහත පරමාණු 2හි අසමානව පවතින උපපරමාණුක අංශුව කුමක් ද? (ල. 01)

IV) උදාසීන ක්ලෝරීන් පරමාණුවක ඉලෙක්ට්‍රෝන වින්‍යාසය ලියන්න. (ල. 01)

7) A) නිශ්චල වස්තුවක් බලයක් යොදා තල්ලු කරන ආකාරය පහත රූපයේ දැක්වේ.



I) වස්තුවේ චලිතයට බාධා පමුණුවන ප්‍රතිරෝධී බලය කවර නමකින් හැඳින්වේද? (ල. 01)

II) වස්තුවක චලිතය ආරම්භ කිරීමට නම් …………..……බලයක් යෙදිය යුතු වේ. (ල. 01)

III) බලය හා චලිතය පිළිබඳ නිව්ටන්ගේ පළමු නියමයට අනුව චලිතය වන වස්තූන්ට බාහිර අසන්තුලිත බලයක් යෙදුවිට කුමක් සිදුවේ ද? (ල. 01)

IV) ස්කන්ධය 5kg වන 10N චලනයකින් ක්‍රියාත්මක වස්තුවක ත්වරණය කොපමණ ද? (ල. 02)

V) ප්‍රවේගය අඩුවීමේ සීඝ්‍රතාවය හඳුන්වන්නේ කෙසේ ද? (ල. 01)

B) I) බැලූනයකින් වාතය පිටවී බැලූනයක් ඉහළ යාමට අදාළව ක්‍රියාව සහ ප්‍රතික්‍රියාව රූපසටහනකින් ලකුණු කොට පෙන්වන්න. (ල. 02)

II) එම සංසිද්ධිය හා බැඳි නිව්ටන්ගේ නියමය කුමක් ද? (ල. 01)

III) වස්තුවක ගම්‍යතාවය ප්‍රකාශකරන ආකාරය සමීකරණයකින් ඉදිරිපත් කරන්න. (ල. 01)

C) I) ඝර්ෂණ බල ඒවා ක්‍රියාකරන අවස්ථා අනුව වර්ග 3කි. ඒ මොනවාද? (ල. 03)

II) ඉහත ඝර්ෂණ බල අතරින් වැඩිම අගයක් ගන්නේ කුමක් ද? (ල. 01)

III) සීමාකාරී ඝර්ෂණ බලය කෙරෙහි බලපාන සාධක දෙකක් සඳහන් කරන්න. (ල. 02)

V) මහන මැෂිමක ඝර්ෂණය අඩුකර ගැනීමට යෙදිය හැකි උපක්‍රමයක් ලියන්න. (ල. 01)




VI) ඉහත ක්‍රියාකාරකම මඟින් සෙවීමට බලාපොරොත්තු වන්නේ සීමාකාරී ඝර්ෂණ බලය කෙරෙහි කවර සාධකයක බලපෑමද? (ල. 01)

VII) වාහනවල රෝදවල කට්ටා කපා ඇත්තේ ඇයි? විද්‍යාත්මකව පැහැදිලි කරන්න. (ල. 02)

8) A) නව සෛල සෑදෙන පරිදි යම් සෛලයක සිදුවන සෛලීය ද්‍රව්‍ය බෙදීමේ ක්‍රියාවලියක අවස්ථා 2ක් පහත A හා B රූපසටහන් මඟින් දක්වයි.



I) නව සෛල සෑදෙන පරිදි යම් සෛලයක සිදුවන සෛලීය ද්‍රව්‍ය බෙදීමේ ක්‍රියාවලිය කවර නමකින් හැඳින්වේද? (ල. 01)

II) එම ක්‍රියාවලියේ A හා B ආකාර 2 කවරේ ද? (ල. 02)

A

B

III) ප්‍රභේදන හට ගැනීම හේතුවෙන් පරිණාමයට වැදගත් වන්නේ ඉහත කවර ආකාරයද? (ල. 01)

IV) තුවාල සුව වීමේදී වැදගත් වන සෛල බෙදීමේ ආකරය කුමක් ද? (ල. 01)

B) I) ජීවීන්ගේ ව්‍යුහමය හා කෘත්‍යමය ඒකකය කුමක් ද? (ල. 01)

II) ශාක සෛලයකට මෙන්ම සත්ව සෛලයකට පොදු වන ඉන්ද්‍රයිකා දෙකක් ලියන්න. (ල. 02)

III) එක් එක් කාර්‍යයට ගැලපෙන ඉන්ද්‍රයිකාව වරහන් තුළින් තෝරා කෘත්‍ය ඉදිරියේ සඳහන් කරන්න

(රයිබොසෝම, ගොල්ගි දේහ, සෛල පටලය, සෛල බිත්තිය, සෛල ප්ලාස්මය, මයිට්‍රකොන්ඩ්‍රියාව

a) හැඩය පවත්වා ගැනීම -

b) සෛල ආවරණයක් ලෙස ක්‍රියා කිරීම -

c) සෛල ඉන්ද්‍රයිකා දැරීම -

d) ප්‍රෝටීන සංශ්ලේෂණය -

e) සෛලීය ශ්වසනය සිදුකිරීම - (ල. 05)

C) I) කිරල ඇබයක ඡේදයක් නිරීක්ෂණය ඇසුරෙන් සෛලය සොයාගනු ලැබූ විද්‍යාඥයා කවුද? (ල. 01)

II) තනි සෛලයකින් සෑදී ඇති ජීවීන් ………………………………..ජීවීන් ලෙසද, සෛල රාශියකින් සෑදී ඇති ජීවීන් ……………………………..ජීවීන් ලෙසද හැඳින්වේ. (ල. 02)

III) සෛල වාදය ඉදිරිපත් කිරීමට දායක වූ විද්‍යාඥයින් දෙදෙනෙකු නම් කරන්න. (ල. 02)

IV) සෛල වාදයේ සඳහන් වන කරුණු 2ක් ලියන්න. (ල. 02)

9) A) කැරම් ලෑල්ලක් මගදී ඩිස්කයට පහරදී නිශ්චලව සිටින ඉත්තකු චලනය කරවීමට කැරම් ක්‍රීඩාවේ දී සිදුවේ.

I) මෙම සිදුවීමට අදාල නිව්ටන් නියමය කුමක් ද? (ල. 01)

II) එම නිව්ටන් නියමය ලියා දක්වන්න. (ල. 02)

III) කැරම් ලෑල්ල මත චලනය වන ඉත්තන්ගේ වේගය වැඩි කිරීමට යොදන උපක්‍රමය කුමක් ද? (ල. 02)

IV) ඉත්තකුගේ ස්කන්ධය 20g නම් $20ms^{-1}$ ත ප්‍රවේගයෙන් චලනය වන විට ක්‍රියාත්මක අසමතුලිත බලය ගණනය කරන්න (ල. 02)

B) නිශ්චලතාවයෙන් ගමන ආරම්භ කළ දුම්රියක සරල රේඛීය මාර්ගයක තත්පර 10ක් තුළදී ගමන්කර 30m ක ප්‍රවේගයක් ලබගනී.

I) ඉහත සඳහන් චලිතයට අදාල ප්‍රවේග කාල ප්‍රස්ථාරය මෙහි ඇඳ දක්වන්න. (ල. 02)




II) දුම්රිය තත්පර 10ක් තුළ ගමන් කර ඇති සරල රේඛීය දුර ගණනය කරන්න. (ල. 02)

III) දුම්රිය චලිත ස්භාවය සඳහන් කරන්න. (ල. 01)

IV) තත්පර 5ක කාලයක් තුලදී දුම්රියේ ප්‍රවේගය කොපමණ ද? (ල. 01)

V) දුම්රියේ ස්කන්ධය 30000නට නම් 5වන තත්පරයේදී දුම්රියේ ගම්‍යතාවය සොයන්න. (ල. 01)

C) වස්තුන් සම්බන්ධව ප්‍රකාශවන පහත සඳහන් වගන්ති වල සත්‍ය අසත්‍යතාව ගලපා √ හා × ලකුණු යොදන්න.

I) වස්තුවක් චලනයවීමේ සිඝ්‍රතාව වේගය ලෙෂ හැඳින්වේ. ( )

II) වස්තුවක් ගමන් කළ විස්ථාපන ගමන් මාර්ගය මත රඳා පවතින අතර දුර රඳාපවතින්නේ අරම්භක ස්ථානනය සහ අවසාන ස්ථානය මත පමණි. ( )

III) ප්‍රවේගයට විශාලත්වයක් මෙන්ම දිශාවක් ද ඇත. ( )

IV) ඒකීය කාලයකදී සිදුවන වේගය ප්‍රවේග වෙනස විස්ථාපනයකි. ( )

IV) වස්තුවක බර යනු එම වස්තුව පොළවේ කේන්ද්‍රය වෙත ඇඳගන්නා බලයයි. ( )

V) චලනය වන වස්තුවක් මත යෙදෙන ඝර්ෂණ බලය ස්ථිතික ඝර්ෂණයයි. ( ) (ල. 06)